# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 29 දරන අර්ථ නිරූපණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 සැප්තැම්බර් මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 සැප්තැම්බර් මස 06 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 29 දරන අර්ථ නිරූපණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 සැප්තැම්බර් මස 06 වන දින]

එල්. ඩී.—ඕ. 44/74

**අර්ථ නිරූපණ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

අර්ථ නිරූපණ ආඥාපනතේ 24 වන වගන්තිය පැනවීමේ දී ව්‍යවස්ථාදායකයේ අභිප්‍රාය පැහැදිලිව හා නොඅනුමානයෙන් ප්‍රකාශ කිරීම හා රජයට සහ රජය වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තන්ට විරුද්ධව ඉන්ජන්ෂන් තහනම් නිකුත් කිරීමට හෝ එසේම ඉටු කිරීම සඳහා වූ ආඥා කිරීමට අධිකරණය සතු අධිකරණ බලය ඉවත් කිරීම අවශ්‍ය වී ඇති හෙයින් :

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 29 දරන අර්ථ නිරූපණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 1972 අංක 18 දරන පනතින් සංශෝධිත අර්ථ නිරූපණ ආඥාපනතේ 24 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කිරීමෙන් ඒ ආඥාපනත මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 2 වන අධිකාරයේ 24 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

'ඉන්ජන්ෂන් තහනම් නිකුත් කිරීමට හෝ එසේම ඉටු කිරීම සඳහා ආඥා කිරීමට අධිකරණයට බලය දෙන ප්‍රඥප්තියක් තේරුම් ගැනීම.

24. (1) මෙම ආඥාපනත ආරම්භ වීමට පෙර හෝ පසු සම්මත කර ගනු ලැබූ යම් ප්‍රඥප්තියක ඇතුළත් කිසිවකින් කවර වූ හෝ හේතුවක් නිසාවත් රජයට, අමාත්‍යවරයකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුට විරුද්ධව ඉන්ජන්ෂන් තහනම් නිකුත් කිරීමේ හෝ එසේම ඉටු කිරීම සඳහා ආඥා කිරීමේ අධිකරණ බලය කිසිම අධිකරණයක් වෙත පැවරෙතැයි නොසැලකිය යුතු ය.

(2) යම් ඉන්ජන්ෂන් තහනමක් නිකුත් කිරීමේ හෝ ආඥාවක් කිරීමේ ප්‍රතිඵලය වන්නේ, කෙළින් ම හෝ අන් අයුරකින්, යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් කටයුතු කර ගෙන යාමෙන් රජය, අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවර යකු වැළැක්වීම හෝ යම් කාරණයක් හෝ දෙයක් කිරීමට රජයට, අමාත්‍යවරයකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුට බල කිරීම හෝ නම්, රාජ්‍ය නිලධර යකුට විරුද්ධව එම ඉන්ජන්ෂන් තහනම නිකුත් කිරීම හෝ ආඥාව කිරීම කිසිම අධිකරණයක් විසින් කවර වූ හෝ හේතුවක් නිසාවත් නොකළ යුතු ය.

(3) මේ වගන්තිය ක්‍රියාත්මක වීමට පෙර යම් අධිකරණයක් විසින් යම් ඉන්ජන්ෂන් තහනමක් නිකුත් කරනු ලැබ ඇත්තාවූත් මේ වගන්තිය එවකට ක්‍රියාත්මකව තිබුණේ නම් එම ඉන්ජන්ෂන් තහනම නිකුත් කිරීමට එම අධිකරණයට අධිකරණ

2—ජ 09215-5,360 (74/09)

බලයක් නොතිබෙන්නට තිබුණාවූත් අවස්ථාවක එම ඉන්ජන්ෂන් තහනම සියලු කාර්යයන් සඳහා ශූන්‍ය ව හා බලරහිතව පැවති ලෙස හා ශූන්‍ය හා බලරහිත විය යුතු ලෙස ද, නිතියෙහි ලා එහි බලයක් හෝ බලපෑමක් නොමැති ලෙස ද සැලකිය යුතු ය.

(4) මේ වගන්තියෙහි "ඉන්ජන්ෂන් තහනම" යන්නට ඒක පාක්ෂික වූ හෝ එසේ නොවූ ස්ථිර හෝ අතුරු ඉන්ජන්ෂන් තහනමක්, වාරණ ආඥාවක් හෝ ඉහතින් වූ උපවගන්තිවල සඳහන් යම් තැනැත්තකු හෝ බලධරයකු ක්‍රියා කිරීමෙන් නැවැත්වීමේ හෝ වැළැක්වීමේ බලපෑම ඇති වෙනත් යම් ආඥාවක් ඇතුළත් වේ.

(5) පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් ප්‍රකාශ කරමින් ආඥාවක් කිරීමට යම් අධිකරණයක් සතු බලය කෙරෙහි මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලින් බලපෑමක් ඇතිවෙතැයි නොසැලකිය යුතු ය.

(6) මේ වගන්තියෙහි විධිවිධාන, මේ ආඥාපනතෙහි 6 වන වගන්තිය හෝ වෙනත් යම් විධිවිධාන හෝ වෙන යම් නීතියක විධිවිධාන හෝ නොතකා බලපැවැත්විය යුතු ය.'.